# රුහුණ විශ්වවිද්‍යාලය
## විද්‍යා පීඨය
## විද්‍යාවේදී සාමාන්‍ය උපාධි තෙවන ස්ථල (පළමු සමාසික) පරීක්ෂණය – 2016 / ජූලි

විෂයය –: **FSC 3112** - කළමනාකරණය

කාලය - : පැය දෙකයි (02)
මුළු ලකුණු – 60 යි

---

*පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.*

01)

i) කළමනාකරුවන් කළමනාකරන නොවන සේවකයන්ගෙන් වෙනස් වන්නේ කෙසේද?

(ලකුණු 02)

ii) විවිධ කළමනාකරණ මට්ටම් විස්තර කරන්න.

(ලකුණු 03)

iii) සියළුම කළමනාකරුවන් විසින් ඉටු කරනු ලබන කාර්යයන් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 03)

iv) කළමනාකරුවන්ට ඔවුන්ගේ සංවිධාන පරිසරය අවබෝධ කර ගැනීම අවශ්‍ය වන්නේ මන්දැයි විස්තර කරන්න.

(ලකුණු 03)

v) රැකියා විස්තරය සහ රැකියා පිරිවිතරය අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 02)

vi) ආකර්ශනය යන පදයෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද? එය සිදු කරනු ලබන ආකාර මොනවාද?

(ලකුණු 03)

vii) විවිධ කළමනාකරණ මට්ටම් වලදී අවශ්‍ය කරනු ලබන කළමනාකාරිත්ව දක්ෂතා කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 02)

(මුළු ලකුණු 18)

**02)**

" සැලසුම්කරණය යනු කළමනාකරුවකු විසින් ඉටු කරනු ලබන වඩාත් වැදගත්ම කාර්යය වේ."

i) ඔබ මෙම ප්‍රකාශය සමග එකග වන්නේද? ඔබගේ පිළිතුර උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ii) සංවිධානයක් විසින් සකසනු ලබන විවිධ සැලසුම් වර්ග මොනවාද? කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iii) සංවිධානයකට සැලසුම්කරණයේ ඇති වැදගත්කම උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 14)

**03)**

i) සංවිධාන ව්‍යුහයක ප්‍රධාන මූලිකාංගයන් විස්තර කරන්න.

(ලකුණු 04)

ii) කළමනාකරුවකුට සංවිධානයක වැඩ කටයුතු දෙපාර්තමේන්තුකරණය කළ හැකි ආකාර පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iii) සංවිධානයක වැඩ කටයුතු විවිධ අංශ සහ දෙපාර්තමේන්තු වලට බෙදීමේ ඇති වැදගත්කම උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 14)

**04)**

i) මැස්ලෝගේ අවශ්‍යතා ධූරාවලි න්‍යාය යනු කුමක්ද? මෙම න්‍යායේ මූලිකාංග, ශක්තීන් සහ සීමාකම් විස්තර කරන්න.

(ලකුණු 04)

ii) සේවක කාර්යසාධනය වර්ධනය කිරීම සඳහා අභිප්‍රේරණයේ කාර්යභාරය උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

(ලකුණු 05)

iii) හර්ස්බර්ග්ට අනුව, "අතෘප්තිය නැතිවීම යනු තෘප්තිය ඇතිවීම නොවේ". ඔබ මෙම ප්‍රකාශය පැහැදිලි කරන්නේ කෙසේද?

(ලකුණු 05)

(මුළු ලකුණු 14)

**05)**

පහත සඳහන් මාතෘකා තුනක් කෙටියෙන් විස්තර කරන්න.

i) කළමනාකාරීත්ව ජාල න්‍යාය (Managerial Grid Theory )

ii) පාලන ක්‍රම (Types of Control)

iii) තෝරා ගැනීමේ ක්‍රම (Selection methods)

iv) පාලන අවකාශය (Span of control )

(මුළු ලකුණු 14)

******************************